# දෙහෙල්ගමුවපුරාණ කන්දෙ රජමහාවිහාරයේ පුස්කොළ පොත්පිළිබඳ අධ්‍යනයක්

ආර්.එම්.අයි.යූ. පතිරණ

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
iroshaudani5@gmail.com

ප්‍රමුඛ පදඃපුස්කොළ, කම්බා, සකියාව, පත්ඉරු

## හැඳින්වීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, දෙහෙල්ගමුව ගමේ පිහිටි දෙහෙල්ගමුව පුරාණ කන්දෙ රජමහා විහාරය ඓතිහාසික මෙන්ම පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන විහාරයකි. මෙම දෙහෙල්ගමුව පුරාණ කන්දෙ රජමහ විහාරයේ අධ්‍යයනය කරන ලද පුස්කොළ පොත් තුළින් විෂය ක්ෂේත්‍රය හදුනාගැනීම මුඛ්‍ය පරමාර්ථය වූ අතර මෙයට අමතර ව කරුණු කිපයක් කෙරෙහි අවධානය යොමු කරන ලදි.

මේ අනුව පුස්කොළ පොතක අඩංගු පත්ඉරු සංඛ්‍යාව, භාෂාව, පැවැත්ම මෙන්ම පුස්කොළ පොතේ ආරක්ෂාව සඳහා යොදා ඇති පොත් කම්බයද අධ්‍යයනය කරන ලදි. එම කම්බා සහ පොත් ලණුව තදවීමට යොදන සකිය සකස් කිරිම සම්බන්ධයෙන්ද අධ්‍යයනය කරන ලදි.

මෙහි දී පුස්කොළ පොතෙහි දිග, පළල, බර මෙන්ම පොතට යොදන කම්බය සකස් කර ඇත්තේ කෙසේද යන්නත් ඒවාට යොදා ඇති මාධ්‍ය, සැරසිලි මොස්තර පිළිබඳ ව අධ්‍යයනය කරන ලදි. එසේ ම පුස්කොළ පොතේ අභ්‍යන්තරයෙහි ඇති පත්ඉරු මත අඳින ලද චිත්‍ර සටහන් ආදිය ද අධ්‍යයනය කරන ලදි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්‍රමවේදය වූයේ දෙහෙල්ගමුව පුරාණ කන්දෙ රජමහා විහාරයේ පුස්කොළ පොත් එකතුව අධ්‍යයනය කිරීම වන අතර මෙයට අමතරව පුස්කොළ පොත් සම්බන්ධ පූර්ව පර්යේෂණ අධ්‍යයනයෙන් දත්ත ලබා ගැනීම සඳහා පුස්තකාල අධ්‍යයනය කරනු ලැබිණි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

අතීතයේ පටන් වත්මන දක්වා ලිවීමට ගන්නා ලේඛන ද්‍රව්‍යයක් ලෙස පුස්කොළ මාධ්‍යය හඳුනාගත හැකි ය. ඝර්ම කලාපීය රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ බහුලව වැඩෙන තල ගසේ ගොබය ලේඛනයට සුදුසු පරිදි සකස් කරලිවීමට භාවිත කිරීම ලංකාවේ ලේඛන කලාවේ සන්ධිස්ථානයකි.

මේ අනුව දෙහෙල්ගමුව පුරාණ කන්දෙ රජමහා විහාරය සතු මෙම පුස්කොළ පොත් එකතුවේ අනාවරණය කරගත් කරුණු රැසකි. සමස්තයක් වශයෙන් වාර්තා කරන ලද පොත් ප්‍රමාණය 50කට ආසන්න අතර එම පොත් විවිධ පැතිකඩ ඔස්සේ විශ්ලේෂණය කළ හැකි ය.

01 ආගමික පොත්

02 සාහිත්‍ය පොත්

03 වෛද්‍යය විද්‍යාවට අයත් පොත්

04 ජොතිෂ්‍ය පොත්

මෙහි දී ආගමික කරුණු ඇතුළත් පුස්කොළ පොත් යටතේ සූත්‍ර විශාල ප්‍රමාණයක් ලියා ඇති අතර ඉන් බ්‍රහ්මජාල හා සතිපට්ඨාන සූත්‍ර වැඩි වශයෙන් හඳුනාගත හැකි ය. සාහිත්‍යය පොත් අතර ජාතක කතා හා බුත්සරණ, රුවන්වැලිසෑ වර්ණනාව වැනි දෑ බහුල ව දක්නට ඇත.

පුස්කොළ පොත්වල පරිමාණය කෙරෙහි අදහස් දැක්වීමේ දී සෑම පොතක්ම පාහේ සෙ.මී. 30ට වඩා දිගින් යුත් අතර මෙහි දී ගොනු කළ හැකි විෂය කරුණු පෘථුලය. පළල සෙ.මී. 2ට වඩා වැඩි අතර ඉන් පත්ඉරු සැකසීමට සශ්‍රීක තල ගස්වල ගොබය භාවිත කර ඇති බව නිගමනය කළ හැකි ය.

මෙම පොත්වල අභ්‍යන්තරව සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී ලියන ලද භාෂාව, අක්ෂර ප්‍රමාණය, අක්ෂර වර්ගය, කාලය, ලියන ලද්දේ කවුරුන් විසින්ද, බරපැන් දැරූ පිරිස, පුස්කොළ පොත් රීතින් අනුගමනය කිරීම හා පත්ඉරුවල ඇති චිත්‍ර සටහන් අධ්‍යයනය කරන ලදි. මෙහි දී අක්ෂර ශෛලින් ලෙස බහුලවගජාක්ෂර, හංසාක්ෂර, යන ඒවා භාවිත කර ඇති අතර බහුතර ප්‍රමාණයක් පොත් පාලි භාෂාවෙන් රචනා කර තිබේ.

බාහිර වශයෙන් පුස්කොළ පොතක වැදගත්කම වැදගත්ම කොටස් කිහිපය වන්නේ පොත් කම්බය, නූල හා සකියාවයි. මෙහි දී පොත් කම්බය සැකසීම සඳහා දැව භාවිත කර ඇති අතර එය ලාක්ෂාවලින් කරන ලද සම්ප්‍රදායික සැරසිලි මෝස්තර යොදා සකසා ඇත. සකියාව ලෝහ මඟින් අලංකාරවත්ව නිර්මාණය කොට තිබේ..

මේ අනුව දෙහෙල්ගමුව පුරාණ කන්දෙ රජමහ විහාරයේ පුස්කොළ පොත් එකතුව තුළින් පුස්කොළ පොත් සම්ප්‍රදායට අයත් කරුණු රැසක් වාර්තා වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ලගමුව, ආරිය. (2007)***ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව.*** කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්මේන්තුව.

විමලරත්න, කේ.ඩී.ජී. (1969)පැරණි ලංකාවේ ග්‍රන්ථ නිෂ්පාදනය. ***අධ්‍යයන සියවස ප්‍රකාශනය.***කොළඹ: අධ්‍යාපන දෙපාර්මේන්තුව.